**2015 නොවැම්බර් 21 වැනිදා විදේශ ඇමති මංගල සමරවීර සමග පැවැත්වූ ද්වි-පාර්ශ්වික රැස්වීමෙන් පසුව එක්සත් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ එක්සත් ජනපදයේ නිත්‍ය නියෝජිත තානාපතිනි සමන්ත පවර් විසින් දැක්වූ අදහස්**

ඇමතිතුමනි, ශ්‍රී ලංකාවට පැමිණීම අසිරිමත් අත්දැකීමකි. මා මෙහි පා තැබුවේ පැය කීපයකට පෙර නමුත් ඔබේ ක්‍රියාශීලි රටේ සාදරණීය උණුසුමත්, සත්කාරයත් මා වෙලා ගෙන ඇති බව දැනේ. අප පළමුවරට හමු වූයේ මේ අවුරුද්දේ පෙබරවාරි මාසයේ දී බව ඔබ සිහිපත් කළේය. මෙතරම් කෙටි කාලයක් තුළ එක්සත් ජනපදයත් ශ්‍රී ලංකාවත් අතර ඇති සබඳතා තුළින් ද්වි-පාර්ශවික කරුණු ගණනාවක් සම්බන්ධයෙන් සහයෝගීව කටයුතු කිරීමට පමණක් නොව පුළුල් ජාත්‍යන්තර ප්‍රජාවේ සාමූහික ආරක්ෂාව ගැනද එක්ව කටයුතු කිරීමට අපට හැකිවී තිබේ.

ශ්‍රී ලංකාව, එක්සත් ජාතීන්ගේ සංවිධානය තුළ, එක්සත් ජනපදයේ අව්‍යාජ හවුල්කරුවෙකි. සැප්තැම්බර් මාසයේ පැවති ජනාධිපති ඔබාමාගේ සාමසාධක සමුළුවට ශ්‍රී ලංකා ජනාධිපති පැමිණි අතර වෙන කිසිම නායකයෙක් නොකළ ඉතා වැදගත් පොරොන්දු ගණනාවක් ලබාදී ඉතා ප්‍රබල ප්‍රකාශයක්ද කළේය. ලොව පුරා මානව හිමිකම් හා ප්‍රජාතන්ත්‍රීය වගවීම් පිලිබඳ ගැටලු වලදී ලෝකයේ වෙනත් ස්ථානවල මෙම අයිතීන් වෙනුවෙන් පෙනී සිටින අපේ සමීප හවුල් කරුවෙක් බවට ශ්‍රී ලංකාව පත්වී තිබේ.

විදේශ ඇමතිවරයා දැන හඳුනා ගැනීමේ වරප්‍රසාදය මට ලැබුණේ මීට මාස නමයකට පෙරය යන්න මට විශ්වාස කළ නොහැකි තරමිය. එක්සත් ජනපදයත් ශ්‍රී ලංකාවත් අතර සහයෝගීතාවේ අනාගතය ගැන සාකච්ඡා කිරීමට මෙහි පැමිණීමට ලැබීම ඇත්ත වශයෙන්ම භාග්‍යයකි. එම සහයෝගිතාව අලුත් හා නැවුම් ආකාරයකින් ඉදිරියට යන බව මගේ විශ්වාසයයි.

මේ 2010 වර්ෂයෙන් පසුව මා ශ්‍රී ලංකාවට පැමිණි පළමු අවස්ථාවයි. මෙහි සිදුවී ඇති සමහර වෙනස්කම් හා ජනතාවගේ උද්යෝගය අප ප්‍රබෝධයට පත් කරවන බව පැවසීමට කැමැත්තෙමි. මා හිතන හැටියට මෑතදී පැවැත්වූ මැතිවරණ දෙකකදී ශ්‍රී ලාංකික ජනතාව බෙදීම වෙනුවට ප්‍රතිසන්ධානයත්, බිය වෙනුවට අපේක්ෂාවේ මාවතත් තෝරා ගනිමින් ප්‍රජාතාන්ත්‍රික හා වග කියන පාලනයක් පිහිටුවා ගෙන තිබේ. ඔබ දන්නා පරිදි මින් අවුරුදු අටකට පෙර ජනාධිපති ඔබාමා ගේ මැතිවරණ ව්‍යාපාරයේ තේමාව වූයේ අපේක්ෂාවයි. ලොව පුරා ත්‍රස්තවාදී ප්‍රහාරයන් සිදුවන අද පවා ලෝක ප්‍රජාවෙන් හා ඇමෙරිකන් ජනතාවෙන් ජනධිපති ඔබාමා ඉල්ලා ඇත්තේ බිය නොවන ලෙසටයි. ඒ වෙනුවට ලොව පුරා මිනිසුන්ට පොදු විශ්ව සාධාරණ අභිලාෂයන් හා මිනිස් අභිමානය ගැන සිත යොමු කරන ලෙසයි.

මා මෙහි සිටින කාලය ඉතා සතුටින් ගත කිරීමටත් ශ්‍රී ලාංකික සමාජයේ පුළුල් පැතිකඩක් සමග අදහස් හුවමාරු කර ගැනීමටත් බලාපොරොත්තු වෙමි. රජයේ විවිධ අංශ සමග හමුවීම් පිළියෙල කර ඇති අතර විරුද්ධ පක්ෂය, සිවිල් සමාජ නායකයන්, මානව හිමිකම් ආරක්ෂකයන් හා මාධ්‍යවේදීන්ද හමුවීමට අපේක්ෂා කරමි. රටේ උතුරු ප්‍රදේශයට යෑමට ලැබීම ගැන මම ඉතා සතුටු වෙමි. මීට අවුරුදු පහකට පෙර මා ගිය ස්ථාන නැවත දැක ගැනීමටත් මෑත කාලයේ ක්‍රියාත්මක වූ අලුත් ප්‍රතිපත්ති වල බලපෑම දැක බලා ගැනීමටත් මට හැකි වනු ඇත.

මෙම ශ්‍රේෂ්ඨ පුරවරයට නැවත පැමිණීමෙන් පසු මට ශිෂ්‍යයන් මුණ ගැසීමේ අවස්ථාවක් උදාවනු ඇත. ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ඔවුන් ඉදිරි මග දකින ආකාරය ඔවුන්ගෙන්ම අසා ගැනීමට මම උත්සාහ කරමි. ඒ මන්ද යත් අද සිටින තරුණයින්ට පැහැපත් හා වඩා සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් නිර්මාණය කරන්නේ ශ්‍රී

ලංකාවේ නායකයන් අද ගන්නා තීරණ තුළින් වන බැවිනි. එම අනාගතය ගොඩනැගීමට මෙම තරුණයන්ට අවස්ථාවක් ලබා දිය යුතුය.

ඇමති තුමා හා ඔහුගේ කණ්ඩායම සමග පැවති ද්වි-පාර්ශවික රැස්වීමේ දී මා සඳහන් කළ කරුණක් අවසාන වශයෙන් ශ්‍රී ලංකාවේ ජනතාවට ද දැන්වීමට කැමැත්තෙමි. එනම් ඔබ කිසිවෙකුටවත් සිතා ගැනිමටවත් නොහැකි තරමට ශ්‍රී ලංකාවේ සිදු වන දේ ගැන මුළු ලෝකයම විමසිල්ලෙන් පසු වන බවයි. පසුගිය මාස නමය හෝ දහය තුළ ඉතා සංකීර්ණ දේශපාලන වතාවරණයක් තුළ ක්‍රියාත්මක කර ඇති වෙනස්කම් මුළු ලෝකයේම අවධානයට යොමුවී තිබේ. මා ඇමතිතුමාට ද කී පරිදි එක් උදාහරණයක් වශයෙන් ලොව පුරා ජනාධිපතිවරුන් ඔවුන්ගේ ධුර කාල හා බලතල වැඩි කර ගැනීමට ව්‍යවස්ථා වෙනස් කරන කාලයක ජනාධිපති බලතල අඩු කිරීමට ඔබේ ජනාධිපති ගෙන ඇති තීරණය දැක්විය හැකයි. මෙය ශ්‍රී ලංකාවේ පරීක්ෂා හා තහංචි නියම ආකාරයෙන් ක්‍රියාත්මක වන බව ශක්තිමත් කිරීමෙහිලා ඉතා වැදගත් වේ. මේවා කොතරම් වැදගත්ද යන්න ගැන සංඥාවක් ලොව පුරා යැවීමත් ඒවා දුර්වලවූ විට මෙම පරීක්ෂාවන් හා තහංචි නැවත ප්‍රතිසංස්ථාපනය කර ශක්තිමත් කිරීමත් අවශ්‍ය වේ. පැරිසියේ,. මාලි රටේ බැමකෝ හා ඊට පෙර බීරුට්, බැගඩැඩ් හා ඇන්කරා හී සිදුවූ පහර දීම්වලින් පෙනී යන්නේ මෙය කොතරම් දුෂ්කරද යන්නයි. ලොව පුරා බොහෝ ප්‍රජාවන්ට මෙය ඉතා දුෂ්කර කාල පරිච්ඡේදයක් වී ඇතත් ශ්‍රී ලංකාව මේ අතින් ලෝකයටම ආදර්ශයක් දුන් රටක් ලෙස කැපී පෙනේ. එය ත්‍රස්තවාදය ජය ගෙන ඇති මෙන්ම දීර්ඝ සිවිල් ගැටුමක දුෂ්කර ඵල විපාක අත්දුටු හා දැන් ඒවා සමනය කිරීමට වෙහෙසෙන රටකි. අද ශ්‍රී ලංකාව අතීතයේ දායදයක් වන මෙම දුෂ්කර ප්‍රශ්නවලට නොබියව මුහුණ දෙමින් දීප්තිමත් අනාගතයක් කරා පිය නගමින් සිටී.

ඔබේ කටයුතු නිරීක්ෂණය කරමින් අපි ඔබට සහයෝගය දක්වමු. මා මෙහි පැමිණ සිටින්නේ වඩාත් ප්‍රබල හා ප්‍රජාතන්ත්‍රවාදී රටක් බවට පත්වීමට ඔබ දරණ ප්‍රයත්නයට ආධාර කිරීමට එක්සත් ජනපදයට තවත් කළ හැක්කේ මොනවාද යන්න ගැන ශ්‍රී ලංකාවේ ජනතාව සමග සාකච්ඡා කිරීමටයි. ඔබ සියලු දෙනාටම ස්තූතියි.